# <u>I ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීම</u>
# <u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි විධිවිධාන සහ දීප ව්‍යාප්ත සේවා ව්‍යවස්ථාවල සඳහන් නිර්බාධක ශ්‍රේණි උසස්වීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස I ශ්‍රේණියේ නිලධාරී සංඛ්‍යාව, I ශ්‍රේණිය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තිබීම සැලකිල්ලට ගෙන දීප ව්‍යාප්ත සේවාවල I ශ්‍රේණියේ තනතුරු වලට වඩාත් සුදුසු නිලධාරීන් අතුරින් සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතුව තෝරාගැනීම සඳහා වන විධිවිධාන 2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියමකර ඇත.

02. ඒ අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම පිණිස සුදුසු නිලධාරීන් තෝරා ගැනීම, 2023.10.16 දින සිට බලාත්මක වන පරිදි උක්ත චක්‍රලේඛයේ අන්තර්කාලීන විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

03. අයදුම් කිරීම :

3.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ 2024.12.31 දින දක්වා පුරප්පාඩු තනතුරු සඳහා **2023.10.16 දින වන විට I ශ්‍රේණියේ තනතුරක් නොදරන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ සියලුම නිලධාරීන්ගෙන්** අයදුම්පත් කැඳවනු ලැබේ.

3.2 ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් ඇමුණුම I අයදුම්පත්‍රය සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව කොළඹ 07, නිදහස් චතුරස්‍රය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2024.02.16 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු වලට පත් කිරීම** යනුවෙන් සඳහන් කළ යුතුය.

3.3 එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම:

4.1 ඉහත 3.1 පරිදි සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් 2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි විධිවිධාන අනුව සම්මුඛ පරීක්ෂණයට ලක්කරන අතර එම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් අංශ යටතේ ලකුණු ලබාදෙනු ලැබේ.

| මාතෘකාව | උපරිම ලකුණු |
|---|---|
| 01. ප්‍රධාන/ කේන්ද්‍රීය නිපුණතාවයන් | 500 |
| 02. පළපුරුද්ද | 400 |
| 03. භාෂා ප්‍රවීණතාවය | 100 |
| මුළු ලකුණු | 1000 |

4.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 ඇමුණුම 01හි සඳහන් මාර්ගෝපදේශ වලට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා කුසලතාවය නිශ්චය කරනු ඇත.

05. තනතුරට පත් කිරීම:

5.1 සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට සති දෙකකට ප්‍රථමව, සත්‍ය වශයෙන්ම ඇති වී තිබෙන පුරප්පාඩු හා 2024.12.31 දින දක්වා ඇති වේ යැයි පුරෝකථනය කරනු ලබන පුරප්පාඩු ලැයිස්තුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන අවස්ථාවේදී තම මනාපය අනුපිළිවෙලින් සටහන් කරන ලද පුරප්පාඩු තනතුරු ලැයිස්තුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත භාර දිය යුතුය.

දිනය : 2024.01.12

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම I

# ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු වලට පත් කිරීම සඳහා වන අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

අයදුම්පත් අංකය | F |

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. 1.1 මුලකුරු සමඟ නම :…………………………………………………………………………මෙය/මිය/මයා

 1.2 සම්පූර්ණ නම :…………………………………………………………………………මෙය/මිය/මයා

2. ජාතික හැඳුනුම්පත් අංකය :…………………………………………………………………………

3. උපන් දිනය :…………………………………………………………………………

4. පෞද්ගලික ලිපිනය :…………………………………………………………………………

5. දුරකථන අංකය 5.1 නිවස:……………………5.2 ජංගම:……………………………

6. විද්‍යුත් ලිපිනය :…………………………………………………………………………

7. දැනට දරන තනතුර :…………………………………………………………………………

8. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :…………………………………………………………………

9. කාර්යාලීය ලිපිනය :…………………………………………………………………………

10. 10.1 කාර්යාලීය දුරකථන අංකය :……………………………………………………………

 10.2 කාර්යාලීය ෆැක්ස් අංකය :……………………………………………………………

11. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට පත්වීමේ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා සේවය කරන ලද සේවා ස්ථාන (රාජකාරි භාරගත් ලිපිවල සහතික පිටපත් අමුණා ඉදිරිපත් කළ යුතුය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියට උසස් වූ දිනය ……………………………………………………………

 (I ශ්‍රේණියට උසස්වීම් ලිපියේ සහතික කළ පිටපත ඇමිණිය යුතුය.)

13. විනයානුකුල කටයුතු :

 13.1 පසුගිය සේවා කාලය තුළ විනය දඬුවමකට ලක් වී තිබේද? ඔව්/නැත

 13.2 13.1සඳහා පිළිතුර "ඔව්" නම් විනය නියෝග ලිපියේ අංකය හා දිනය සඳහන් කරන්න.

 අංකය : ……………………………….. දිනය : ……………………………………..

**සටහන : නොගැළපෙන වචන කපා හරින්න**

ඉහත අංක 01 සිට 13 දක්වා තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය: ..................................... ……………………………..

ඉල්ලුම්කරුගේ අත්සන
තනතුරු නාමය

**(ආ) කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,…………………………………………………………………………………..............අමාත්‍යාංශය

1. නිලධාරියා සම්බන්ධව මේ වනවිට විනය කටයුත්තක් ආරම්භ කිරීමට කටයුතු කරමින්/ විනය පරීක්ෂණයක් සිදුවෙමින් පවතියි/ නොපවතියි.............................................

   1.1 ඉහත පිළිතුර "පවතියි" නම් එහි වර්තමාන තත්ත්වය :

   ……………………………………………….....................................................................................

2. ඉහත 11 සිට 13 දක්වා කරුණු නිවැරදි බව සහතික කරමි.
3. නිලධාරියාගේ අයදුම්පත්‍රය නිර්දේශ කරමි/ නොකරමි.

දිනය : …………………………………. ……………………………….

දෙපාර්තමේන්තු / ආයතන
ප්‍රධානියාගේ අත්සන,
තනතුරු නාමය සහ
නිල මුද්‍රාව

**සටහන : නොගැළපෙන වචන කපා හරින්න**

**(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ...................................................... මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරක් සඳහා පත්කිරීම නිර්දේශ කරමි/ නොකරමි.*

( * නිර්දේශ නොකරන්නේනම්, හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)

.....................................................................................................................................................

දිනය :……………………………….

…………………………
ලේකම්,
..........................................................
........................... අමාත්‍යාංශය
නිල මුද්‍රාව

**සටහන : නොගැළපෙන වචන කපා හරින්න**